# හවුල් ව්‍යාපාර නාමයක් ලියාපදිංචිය කිරීම සඳහා වූ උපදෙස්

ඉල්ලුම්පත්‍රය සම්පූර්ණ කිරීමට ප්‍රථම පහත සඳහන් උපදෙස් හොඳින් අධ්‍යනය කරන්න.

## ඉල්ලුම්පත්‍රය සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්

1. 2011 අංක 05 දරන බස්නාහිර පළාතේ වෙළඳ, සංස්ථා හා සංස්ථාගත කරනු නොලැබූ වෙළඳ ආයතනයන්හි ව්‍යාපාර නාම ප්‍රඥප්තියේ 8 වගන්තිය ප්‍රකාර, තහනම් ව්‍යාපාර නාම භාවිතා කිරීමෙන් වැළකිය යුතුය.
2. වෙළඳාමක්, ආනයන, අපනයන කිරීමක් හෝ නිෂ්පාදනයක් නම් වෙළඳාම් කරනු ලබන, ආනයන, අපනයන හෝ නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ කාණ්ඩය , වර්ගය පැහැදිලිව සඳහන් කරන්න.
3. ව්‍යාපාරය ආරම්භ කළ දින සිට දින 14ක් ඇතුළත හෝ උපරිම දින 30ක් දක්වා ඉඩ දෙනු ලැබූ අතිරේක කාල සීමාවක් ඇතුළත හෝ ව්‍යාපාර නාම ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කළ යුතු ය.
4. මුල් අකුරුවලින් හැඳින්වෙන වාසගම ඇතුළුව සම්පූර්ණ නම සඳහන් කරන්න. සාමාන්‍යයෙන් භාවිතා වන නමට අමතරව වෙනත් නමක් ඇතොත් එය (සම්පූර්ණයෙන්) විවාහක කාන්තාවක් සම්බන්ධයෙන් නම් විවාහයට පෙර නම (සම්පූර්ණයෙන්) සඳහන් කරන්න.
5. ඉල්ලුම් පත්‍රයට අත්සන් තැබිය යුත්තේ ව්‍යාපාරය අයිතිකරුවන්ගේ පුද්ගලික නමින් විනා ව්‍යාපාරයෙහි නාමයෙන් නොවේ.
6. මෙම ඉල්ලුම්පත්‍රය මඟින් ප්‍රකාශිත තොරතුරු අයිතිකරුවන් වන සියලුම හවුල්කරුවන් විසින් වෙන වෙනම දිවුරුම් සහතිකයක් / ප්‍රතිඥා ප්‍රකාශයක් මඟින් සනාථ කර ඉදිරිපත් කළ යුතුය.

## හවුල් ව්‍යාපාර නාමයක් ලියාපදිංචි කිරීමේ දී ලබා ගත යුතු ලියවිලි

I. බීඑන්ආර් -03 ආකෘති පත්‍රය

II. අයිතිකරුගේ ජාතික හැඳුනුම්පතෙහි හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රයෙහි හෝ වලංගු රියදුරු බලපත්‍රයෙහි සත්‍ය පිටපත

III. ව්‍යාපාරය පවත්වා ගෙන යන බවට ග්‍රාම නිලධාරි වාර්තාව (මෙය ප්‍රාදේශිය ලේකම් විසින් අනු අත්සන් කර තිබිය යුතුය.)

IV. ව්‍යාපාරික ස්ථානය සම්බන්ධයෙන් හිමිකම පැවරුණු බව තහවුරු කරනු ලබන ඔප්පුවෙහි හෝ බදු ගිවිසුමෙහි හෝ කුලී ගිවිසුමෙහි හෝ නොතාරිස්වරයෙකු සහතික කරන ලද පිටපත

V. ව්‍යාපාරික ස්ථානය සම්බන්ධයෙන් වෙනත් පාර්ශවයක් වෙත ඔප්පුවක් මඟින් හිමිකම පැවරී ඇති අවස්ථාවක, ඉහත ලේඛනයට අමතරව, විෂයගත දේපළ සම්බන්ධයෙන් ඉල්ලුම්කරන්නාට ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීම සඳහා දේපළෙහි අයිතිවාසිකම් ඇති පාර්ශවය විසින් නිත්‍යානුකූල අවසරයක් ලබා දෙන බවට හෝ ලබා දී ඇති බවට කරනු ලබන දිවුරුම් ප්‍රකාශයක් හෝ ප්‍රතිඥා ප්‍රකාශයක් හා අයිතිවාසිකම් ඇති පාර්ශවයේ ජාතික හැඳුනුම්පතෙහි හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රයෙහි හෝ වලංගු රියදුරු බලපත්‍රයෙහි සත්‍ය පිටපත

VI. ඉල්ලුම්පත්‍රය මගින් ප්‍රකාශිත තොරතුරු සනාථ කිරීම සඳහා සියලුම හවුල්කරුවන් විසින් වෙන වෙනම ඉදිරිපත් කරනු ලබන දිවුරුම් සහතිකය, ප්‍රතිඥා ප්‍රකාශය

**VII.** රෙජිස්ට්‍රාර් විසින් අවස්ථානුකූලව කැඳවිය හැකි වෙනත් ලියවිලි ඇතොත් ඒවා